# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
## 2014 ජූනි මස 17 වන දින පෙ.ව 9.30ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

**01.** **ගරු අජන්ත නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන , නීතිය හා සාමය , ඉඩම් , අධ්‍යාපන , පළාත් පාලන හා පළාත් පරිපාලන මිනිස්බල හා රැකිරක්ෂා , ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.06.03. දින අසන ලද ප්‍රශ්නය:**

(ප්‍ර / VI (1) / 14 / 01)

(අ) බස්නාහිර පළාතේ දිස්ත්‍රික් තුනෙහි බස්නාහිර පළාත් සභාව යටතේ පාලනය වන පාසැල්වල 2013 වසරේ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල අනුව එම දිස්ත්‍රික් 03 සඳහා ශ්‍රී ලංකාවේ හිමි වී ඇති ස්ථාන තුන කවරේද?

(ආ) බස්නාහිර පළාත් සභාව යටතේ 2013 සමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව කොපමණද?

(ඇ) පළාත් සභාව යටතේ පාලනය වන පාසල් වලින් ගණිතය විෂයන් අසමත් වූ සිසු සිසුවියන් සංඛ්‍යාව කියද?

(ඈ) පළාත් සභාව යටතේ පාලනය වන පාසැල්වල ඉංග්‍රීසි විෂයන් අසමත් වූ සිසු සිසුවියන් කියද?

(ඉ) එම ප්‍රතිඵල පිළිබඳ ඔබතුමා සෑහීමකට පත්වේද?

(ඊ) නො එසේ නම් ඒ මන්ද? ගත් පියවර කවරේද?

**02.** **ගරු ලක්ෂ්මන් නිපුනආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන , නීතිය හා සාමය , ඉඩම් , අධ්‍යාපන , පළාත් පාලන හා පළාත් පරිපාලන , මිනිස්බල හා රැකිරක්ෂා , ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.06.03. දින අසන ලද ප්‍රශ්නය:**

(ප්‍ර / VI (1) / 14 / 02)

(අ) i. උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමට පියවර ගනු ලබුවේද?

ii. තෝරා ගැනීම සිදුකලේ කවර පදනමකින්ද?

iii. ගුරුවරුන් ලෙස කී දෙනෙකු බඳවාගනු ලැබුවේද?

iv. කුමන විෂයන් වෙනුවෙන්ද?

(ආ) i. ඒ ඒ විෂයයන්ට අනුව තවදුරටත් පළාතේ ගුරුවරුන්ගේ පුරප්පාඩු කවරේද?

ii. එකී විෂයයන් වෙනුවෙන් උපාධිධාරීන් බඳවා ගැනීමට පියවර ගන්නේද?

iii. බඳවා ගැනීමට කටයුතු කරන ක්‍රමවේදය කවරේද?

iv. අවශ්‍ය පියවර ගන්නා කාල වකවානුව සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම් මන්ද?

03. ගරු ලක්ෂ්මන් නිපුනආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන , නීතිය හා සාමය , ඉඩම් , අධ්‍යාපන , පළාත් පාලන හා පළාත් පරිපාලන , මිනිස්බල හා රැකිරක්ෂා , ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.06.03. දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර / VI (1) / 14 / 04)

(අ) (i) පළාත් පාලන මාර්ග විෂයට අදාල කටයුතු කවරේද ? යන්නත්,

(ii) එකී කටයුතු වලට අනුව වැඩ සැලසුමක් තිබේද? යන්නත්,

(iii) සැලසුමට අදාල කාර්යයන් මොනවාද? යන්නත්,
සභාවට දන්වන්නේද?

(ආ) පළාත් පාලන ආයතන වලට අයිති මාර්ග බොහොමයක් මාර්ග සංවර්ධනය පැත්තෙන් සතුටුදායක නොවන බව පිළිගන්නේද?

(ඇ) පිළිගන්නේ නම් ගන්නා වූ ක්‍රියා මාර්ග කවරේද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

04. ගරු යූ. ජෝර්ජ් පෙරේරා මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන , නීතිය හා සාමය , ඉඩම් , අධ්‍යාපන , පළාත් පාලන හා පළාත් පරිපාලන , මිනිස්බල හා රැකිරක්ෂා , ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.06.03. දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර / VI (1) / 14 / 05)

(අ) ඔබතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක සභා රැස්වීම් පවත්වන්නේ මාසයකට වරක්ද ? මාස 03කට වරක්ද? නොඑසේ නම් කාල වකවානුව ලබාදිය හැකිද?

(ආ) දිස්ත්‍රික් 3හි අධ්‍යාපන කලාප හා කොට්ඨාශ මට්ටමේ මන්ත්‍රී ව්‍යුහ කමිටු පවත්වන්නේ කෙසේද? එම වැඩ පිළිවෙල ඉදිරිපත් කරනවාද?

(ඇ) එම මන්ත්‍රී ව්‍යුහ කමිටු සදහා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවාද?

(ඈ) පාසැල් වල කළාප හා කොට්ඨාශ මට්ටමේ විදුහල්පති රැස්වීම් පවත්වන්නේ ද? එම කාලපරිච්ඡේදය සදහන් කල හැකිද?

(ඉ) කලාප වල සහ කොට්ඨාශවල සිටින ගුරු උපදේශකවරුන්ට රැස්වීම් පවත්වන්නේද? ඒ කුමන අකාරයටද?

05. ගරු අශෝක දයාරත්න මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නීතිය හා සාමය , ඉඩම් , අධ්‍යාපන , පළාත් පාලන හා පළාත් පරිපාලන , මිනිස්බල හා රැකිරක්ෂා , ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.06.03. දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර / VI (1) / 14 / 06)

(අ) බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කය තුල බස්නාහිර පලාත් සභාව යටතේ පාලනය වන පාසැල් වල විශේෂ අධ්‍යාපන ඒකක කොපමණ ප්‍රමාණයක් තිබේද?

(ආ) එක් පන්ති කාමරයක සිටිය හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

(ඇ) එක් ගුරුවරියක් සදහා භාරදෙන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

(ඈ) විශේෂ අධ්‍යාපන ඒකක සදහා වෙනම ප්‍රතිපාදන බස්නාහිර පළාත් සභාව තුලින් ලබා දෙන්නේද?

(ඉ) විශේෂ අධ්‍යාපන ඒකක වල ගුරුවරුන් සදහා විශේෂ පුහුණු විම් ලබා දෙන්නේද?

(ඊ) පාසැල් වල පවත්වාගෙන යන විශේෂ අධ්‍යාපන ඒකක වල වත්මන් ක්‍රියාකාරීත්වය සම්බන්ධව ඔබතුමා සෑහීමකට පත්වන්නේද?

(උ) දරුවන්ගේ මානසික වර්ධනය වෙනුවෙන් නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඔබතුමාගේ එකගතාවය කෙසේද?

06. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන , නීතිය හා සාමය , ඉඩම් , අධ්‍යාපන , පළාත් පාලන හා පළාත් පරිපාලන , මිනිස්බල හා රැකිරක්ෂා , ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.06.03. දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර / VI (1) / 14 / 07)

(අ) බස්නාහිර පළාතේ නොතාරිස්වරුන් ලියා සහතික කරනු ලබන ඔප්පු සඳහා මුද්දර ගාස්තු ගෙවිය යුත්තේ 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය හා එහි සංශෝධන අනුව බව ඔබතුමා පිළිගන්නේද?

(ආ) නොතාරිස්වරු ලියා සහතික කරන ඔප්පුවල ඇතුලත් ඉඩම් තක්සේරු කිරීම සඳහා නිසි බලයක් බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියෙහි ඇතුලත්ව ඇත්ද? එසේ ඇතුලත් වන්නේ නම් ඒ කුමන වගන්තීන් වලද?

(ඇ) නොතාරිස්වරු විසින් ඔප්පු වල ඇතුලත්කල ප්‍රතිෂ්ඨාවන් අභිබවා යමින් මුදලක් තක්සේරු කිරීම සඳහා උක්ත ප්‍රඥප්තියෙන් බලය පැවරී ඇත්ද?

(ඈ) බස්නාහිර පලාතේ, ආදායම් දෙපාර්තුමේන්තුවේ තක්සේරු ඒකකයක හෝ කිහිපයක් පවතින්නේද? එම තක්සේරුවන්ගේ නම් හා නිශ්චල දේපල තක්සේරු කිරීමට අදාලව ඔවුන්ගේ සුදුසුකම් කවරේද?

(ඉ) එලෙස නිශ්චල දේපල තක්සේරු කිරීමට නිසි සුදුසුකම් තිබේනම් නිශ්චල දේපල තක්සේරු කිරීමට භාවිතා කරනු , ලබන නිර්ණායක කවරේද?

(ඊ) වටිනාකම මත ගෙවිය යුතු මුද්දර ගාස්තුව තීරණය කිරීම සඳහා දැනට බස්නාහිර පළාතේ ආදායම් දෙපාර්තමේන්තුවේ ඇති ක්‍රමවේදය කුමක්ද?

(උ) මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම ආරම්භ කලේ 1990 අංක 6 දරන මුදල් ප්‍රඥප්තිය සම්මත වී වසර කියකට පසුවද? ප්‍රථමයෙන් ක්‍රියාත්මක කල වර්ෂය කුමක්ද?

07. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන , නීතිය හා සාමය , ඉඩම් , අධ්‍යාපන , පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා , ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.06.03. දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර / VI (1) / 14 / 08)

(අ) බස්නාහිර පළාත් සභාවට අයත් පාසල් සංඛ්‍යාව කලාප මට්ටමින් කොපමණද?

(ආ) එම පාසල් සංඛ්‍යාව පාසල් වර්ගය අනුව ඒ ඒ වර්ගයෙන් කොපමණ සංඛ්‍යාවක් බැගින් තිබේද?

(ඇ) ඒ ඒ පාසල් වර්ගය අනුව විදුහල්පති පුරප්පාඩු කොපමණ සංඛ්‍යාවක් තිබේද?

(ඈ) පාසල් වර්ගය අනුව වැඩබලන විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව කොපමණද?

(ඉ) විදුහල්පතිවරුන් ලෙස කටයුතු නොකරන ඒ ඒ ශ්‍රේණි අනුව විදුහල්පති පත්වීම්ලාභින් කොපමණ ප්‍රමාණයන් පළාත තුල සිටිද?

(ඊ) නිසි ක්‍රමවේදයන් බැහැරව පාසල් කියකට විදුහල්පති වරුන් පත්කර තිබේද?

(උ) විධිමත් ආකාරයෙන් හා විනිවිද පෙනෙන සේ ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ හරහා පාසල් වර්ගයට අනුව නියමිත සුදුසුකම් සහිත විදුහල්පතිවරුන් තෝරා පාසල්වලට විදුහල්පතිවරුන් පත් කිරීමට තිබෙන බාධාව කුමක්ද?

(ඌ) බාධාවක් නොමැතිනම් එසේ නොකරන්නේ මන්ද?

**08.** ගරු ලක්ෂ්මන් නිපුනආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යොවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදාහැරීම, සමුපකාර සංවර්ධන ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට ;

(ප්‍ර / VI (1) / 14 / 10 )

ඇ) 2004-12-31 දිනට බස්නාහිර පළාත් සමුපකාර විෂය යටතේ පැවති විවිධ සේවා සමුපකාර සමිති ඒ ඒ දිස්ත්‍රික්කයට අනුව කියද?

ආ) 2013-12-31 දිනට බස්නාහිර පළාත් සමුපකාර විෂය යටතේ පැවති විවිධ සේවා සමුපකාර සමිති ඒ ඒ දිස්ත්‍රික්කයට අනුව කියද?

ඇ) 2004-12-31 දිනට බස්නාහිර පළාත් විවිධ සේවා සමුපකාර සමිතිවලට අදාල ප්‍රාදේශිකයන් ගණන කියද?

ඈ) 2013-12-31 දිනට බස්නාහිර පළාත් විවිධ සේවා සමුපකාර සමිතිවලට අදාල ප්‍රාදේශිකයන් ගණන කියද?

ඉ) ඉහත ප්‍රශ්ණ කිරීමට අනුව ප්‍රාදේශික සංඛ්‍යාව වැඩි වී ඇති විවිධ සේවා සමුපකාර සමිති ගණන කියද?

ඊ) ඉහත ප්‍රශ්ණ කිරීමට අනුව ප්‍රාදේශිය සංඛ්‍යාව අඩු වී ඇති විවිධ සේවා සමුපකාර සමිති ගණන කියද?

උ) නොඑසේ නම් ඒ මන්ද?

**09.** **ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නීතිය හා සාමය , ඉඩම් , අධ්‍යාපන , පළාත් පාලන හා පළාත් පරිපාලන , මිනිස්බල හ රැකිරක්ෂා , ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට:**

(ප්‍ර / VI (1) / 14 / 11

(ඇ) කොළඹ මහ නගර සභාවට අයත් ලිපිගොනු රාශියක් බොරැල්ල කනත්තේ දී වර්ෂ 2013 අගෝස්තු 17 වන දින පුළුස්සා විනාශ කරන ලද්දේද?

(ආ) එම පිලිස්සීම සදහා ගරු නගරාධිපතිතුමාගේ / නියෝජ්‍ය නගරාධිපතිතුමාගේ / මහ සභාවේ / ආයතන කමිටුවේ අවසරය ගෙන තිබුණේද? නැතහොත් අවම තරමින් ඔවුන් හෝ එම ආයතනයන් දැනුවත් කර තිබුනේද?

(ඇ) එම පිලිස්සීමෙන් පහත නෛතික ප්‍රතිපාදන උල්ලංඝනය වී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

1) ජාතික ලේඛනාරක්ෂක පනතේ 16(1) (අ)' , 16(1)(උ)ප්‍රතිපාදන

11) ආයතන සංග්‍රයේ පළවන කාණ්ඩයේ xxviii ඡේදයේ 9.6 සහ 9.8 වගන්තිවල ප්‍රතිපාදන

111) මහ නගර සභා අඥා පනතේ 172 වගන්තිය

(ඈ) එම ලිපි ගොනු ජාතික ලේඛනාරක්ෂක පනතේ 16(1) (අ)', 16 (1)(උ) හි නියෝග 301 න් කුමකට අදාළද?

(ඉ) ආයතන සංග්‍රහයේ 9,6 වගන්තිය අනුව අංක යෙදීම අනිවාර්ය බව ඔබතුමා පිළිගන්නේද?

(ඊ) පුළුස්සන ලද ලිපිලේඛන ඇතුලත් ඉදිරිපත් කරන ලද ලේඛනයේ අංක 54 සිට 126 දක්වා ලිපිගොනුවල අනු අංකය වෙනුවට ඉරිකැල්ලක් පමණක් ඇති බව ඔබතුමා දන්නේද?

(උ) උක්ත ගැටළුවට අදාලව පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයන්හි වත්මන් ප්‍රගතිය කුමක්ද?

0 C V 5 S B

10. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන , නීතිය හා සාමය , ඉඩම් , අධ්‍යාපන , පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා , ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර / VI (1) / 14 / 12)

(අ) වත්තල ප්‍රාදේශිය සභාවට අයත් අල්විස්වත්ත සාගර ක්‍රීඩා පිටියට (ප්‍රාදේශිය සභා ක්‍රීඩා පිටිය) අප්‍රේල් සිංහල දෙමළ අවුරුදුවලින් පසු දිනකදි බොරළු පස් ටිපර් මගින් ගෙනවිත් තැනින් තැන ගොඩ ගසා ඇති බව ඔබ දන්නේද?

(ආ) දින 40 කට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබුනද, එම පස් තුනීකර නොමැති නිසා ක්‍රීඩා කිරීමට ඇති ඉඩකඩ අවහිර වී ඇති බව පිලිගන්නේද?

(ඇ) එසේ නම් එම පස් තුනීකර එම ක්‍රීඩා පිටිය තුල ක්‍රීඩා කිරීමට හැකි ලෙස එය සකස් කිරීමට පියවර ගන්නේද?

(ඈ) එසේ පියවර ගනු ලබන්නේ කවදා සිටද?

11. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන , නීතිය හා සාමය , ඉඩම් , අධ්‍යාපන , පළාත් පාලන හා පළාත් පරිපාලන , මිනිස්බල හා රැකිරක්ෂා , ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර / VI (1) / 14 / 13)

(අ) කොළඹ මහ නගර සභා සීමාව තුල පිහිටා තිබූ ශාන්ත ජෝන් මාළු වෙළඳසැ පැලියගොඩට රැගෙන ගිය බව ඔබතුමා දන්නේද?

(ආ) රැගෙන යන විට එහි සිල්ලර වෙළදාම කළ වෙළද ප්‍රජාව කොපමනද?

(ඇ) පැලියගොඩ නව මාළු වෙළද සංකීර්ණය විවෘත කරන අවස්ථාව වන වි සිල්ලර මාළු වෙළදසැල් කියක් වෙළද ප්‍රජාවට ලබාදුන්නේද?

(ඈ) එසේ ලබාදුන් සිල්ලර මාළු වෙළදසැල් කියක් වැසී ගොස් ඇද්ද?

(ඉ) එසේ වැසී ගොස් ඇත්තේ,වෙළදාමේ අඩුකම නිසා බව ඔබතුමා පිලිගන්නේ ද?

(ඊ) මැනිං එළවළු වෙළද සැලද පැලියගොඩ ප්‍රදේශයට රැගෙන යාමට සැලැස්මෙ පවතින්නේද?

(උ) එසේ වුවහොත් ඉහත (ඈ) සහ (ඉ) ඡේදවල අන්දමට වෙළදාම අඩු වෙළදසැල් වැසී යාමේ තර්ජනයකට මුහුණදීම යථාර්ථය බව ඔබතු පිලිගන්නේද?

(ඌ) එසේ නම් එළවළු වෙළදාම සඳහා හොඳ විකල්ප ස්ථානයක් යෝජ නොකරන්නේ මන්ද?

12. ගරු අජන්ත නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන,සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර / VI (1) / 14 / 14)

(අ) කැස්බෑව වැව ආශ්‍රිත ව්‍යාපෘතිය සඳහා මෙතෙක් වියදම් කළ මුදල කොපමණද? වෙන්කල මුදල කොපමණද?

(ආ) මුල්ගල තැබූ දිනය කවදාද?

(ඇ) එම සම්පූර්ණ ව්‍යාපෘතිය අවසන් කිරීමට වැයවුන මුදල කොපමණද?

(ඈ) එය නිම කිරීමට කොපමණ කාලයක් ගතවේද?

(ඉ) එම ව්‍යාපෘතිය කරනු ලබන ආයතනය කුමක්ද?

(ඊ) වැඩ අවසන් කිරීමට ප්‍රමාද වීමට හේතුව කුමක්ද?

13. ගරු අජන්ත නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන , නීතිය හා සාමය , ඉඩම් , අධ්‍යාපන , පළාත් පාලන හා පළාත් පරිපාලනු මිනිස්බල හා රැකිරක්ෂා , ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර / VI (1) / 14 / 15)

(අ) පසුගිය පස්වන පළාත් සභාවේ ඒකමතිකව අනුමත කරන ලද පෞද්ගලික රථගාල් සඳහා මුදල් අයකිරීම තහනම් කිරීමේ යෝජනාවට අදාලව මෙතෙක් ඔබතුමා ගත් පියවර කුමක්ද?

(ආ) දැනට මුදල් අයකරන පෞද්ගලික රෝහල් ඇතුළු අනෙකුත් ආයතන එම අයකිරීම නවතා දැමීමට ගත් පියවර කුමක්ද?

(ඇ) මේ සම්බන්ධව ප්‍රඥප්තියක් සකස් කිරීමට නොහැකි වීමට හේතුව කුමක්ද?

(ඈ) පලාත්පාලන කොමසාරිස් විසින් නාගරික සංවර්ධන අධිකාරිය සමග ආරම්භ කල වැඩ පිළිවෙල කවරේද?වත්මන් තත්වය කුමක්ද?

14. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නීතිය හා සාමය , ඉඩම් , අධ්‍යාපන , පළාත් පාලන හා පළාත් පරිපාලනු මිනිස්බල හ රැකිරක්ෂා , ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර / VI (1) / 14 / 16)

(අ) 1) කොළඹ අශෝක විද්‍යාලයට පත්කල විදුහල්පති වරයා විධිමත්ව ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගත් අයෙක් නොවන නිසා ගුරු මණ්ඩලය හා ඔහු අතර විරසකතාවයක් හට ගැනීමත් සමග පාසැල් පරිපාලනය ව්‍යාකූල වී ඇති බව දන්නේද?

11) 2014-05-19 ඔබ විසින් රාජකාරි වේලාවෙන් පසු බලහත්කාරීව රැස්වීමක් කැඳවා ඊට සහභාගී නොවූ ගුරුවරුන් ස්ථාන මාරුකරන බවට තර්ජනය කළ බව පිළිගන්නේ ද?

111) මේ හේතුවෙන් තවදුරටත් පාසැලේ රැඳී සිටීම ප්‍රතික්ෂේප කර ඇති ගුරුවරුන් 30 කට ආසන්න පිරිසක් මේ වන විට පාසැලෙන් ස්ථානමාරු කර ඇති බව දන්නේද?

(ආ) එකී ගුරුවරුන් අ.පො.ස(සා.පෙළ),(උ.පෙළ) හා ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන්ට ඉගැන්වීම් කල ප්‍රවීණ ගුරුවරුන් බවත් , ඔවුන් වෙනුවට පාසැලට පත්කර ඇති ගුරුවරුන් අත්දැකීම් රහිත හෝ නුපුහුණු නව පත්වීම්ලාභීන් බවත් පිළිගන්නේ ද?

(ඇ) සුදුසුකම් නොමැති විදුහල්පති වරයා ආරක්ෂා කිරීම සඳහා ගුරුවරුන් 30 කට ආසන්න ප්‍රමාණයක් ද්වේශ සහගතව ස්ථාන මාරු කිරීමෙන් විභාග අභිමුඛව සිටින පාසැලේ දරුවන් අවිනිශ්චිත බියකින් මානසිකව පීඩා විඳින බැවින් පාසැලේ දරුවන්ගේ අධ්‍යාපනය හා පරිපාලනය කඩා වැටීමේ සම්පූර්ණ වගකීම ඔබතුමා භාර ගන්නේද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ කටයුතු

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :**

යෝජනාව :

*"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය"*

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

1 . ගරු අජන්ත නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා:

"බස්නාහිර පළාත තුල කැලි කසල, ඝන අපද්‍රව්‍ය නිසි අයුරින් පාලනය කිරීම, එකතු කිරීම, බැහැර කිරීම හා එහි අතුරුඵල ලෙස විදුලි නිෂ්පාදනය කිරීම, හා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය, සාර්ථකව ක්‍රියාත්මක කිරීමට බස්නාහිර පළාතේ ඝන අපද්‍රව්‍ය අධිකාරිය පුරා වසර 07 කට අධික කාලයක් තිස්සේ අපොහොසත් වී ඇත.

මෙම කාලය තුළ පළාතේ ප්‍රධානතම හා අත්‍යාවශ්‍යම විෂයයක් වන මෙම ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායිත්වය ඉහළ තත්වයක ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පළාතටම දැනී ඇත.

එම නිසා නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනට කරගෙන යනු ලබන නගර සංවර්ධන ක්‍රියාවලිය තවත් ශක්තිමත් කරමින් මෙවැනි ව්‍යාපෘති සඳහා වඩාත් බල සහිත මූලය ශක්තියෙන් හෙබි තාක්ෂණික හැකියාවක් ඇති මධ්‍යම රජය සතු නාගරික සංවර්ධන අධිකාරිය හා ඒකාබද්ධව යම් කාල රාමුවකට සීමා කරන ලද කෙටි කාලීන හා දිගු කාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පළාත් සභාව අදහස් කරයි. '

(යෝ / VI (1) / 14 / 01)

2 . ගරු මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමා :

'බස්නාහිර පළාත තුළ ජීවත් වන පාසැල් යන වයසේ දරුවන් අද දවසේ නොයෙකුත් රෝග පීඩා වලට බහුලව ගොදුරු වන අවස්ථා අප දැක ඇත. එයට බලපාන ප්‍රධාන හේතුව අයහපත් සෞඛ්‍ය පුරුදු සහ චර්යා පද්ධතිවල තිබෙන අසාමාන්‍ය වූ වෙනස්කම්ය. මේ නිසා බෝ නොවෙන රෝග වලට දරුවන් ගොදුරු වන අවස්ථා බොහෝය.

එසේම මාරාන්තික ඩෙංගු රෝගයට ද දරුවන් බහුල වශයෙන් ගොදුරු වන අතර, එයට බලපා ඇත්තේ පරිසරය පිරිසිදුවට තබා ගැනීමට අප ගන්නා උනන්දුවේ මදිකම බව පැහැදිලි වී ඇත. මෙම සියළු . තත්වයන් සලකා මෙවැනි රෝග පීඩා වලින් දරුවන් ගලවා ගැනීමේ පියවරක් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය (බස්නාහිර පළාතේ) එක්ව පාසල් තුල සෞඛ්‍ය සමාජ පිහිටුවා, ඒ තුලින් දරුවන් දැනුවත් කිරීම, රෝග සඳහා ඖෂධ සහ උපදෙස් ලබා දීම හා පරිසරය පිරිසිදු කිරීම වැනි කාරණා සඳහා නීතිමය රාමුවක් තුලින් මැදිහත් විය යුතුයැයි මෙම පළාත් සභාව යෝජනා කර සිටියි. '

(යෝ / VI (1) / 14 / 02)

## XI. පොදු කටයුතු

I . ගරු කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන,සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා, (බ.ප.) විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය;

> ‘2013 අංක .... දරන බස්නාහිර පළාතේ සුළු වාරිමාර්ග ප්‍රඥප්තිය,

( පළමුවර කියවීම)

පළාත් එකකට වැඩි සංඛ්‍යාවක් හරහා දිවෙන ගංගාවලට අදාළ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර බස්නාහිර පළාත තුළ වූ සියලු සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම සැළසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඇතුලුව සුළු වාරි කර්මාන්ත ඉදි කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ නඩත්තු කිරීමට අදාල නීතිය සංස්ථාපනය කිරීම පිණිසද,ඊට සම්බන්ධ වූ හෝ ආනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තියේ විධිවිධාන (453 වන අධිකාරිය වූ) වාරිමාර්ග ආඥා පනතේ විධිවිධාන සමග අනනුකූල වේ.

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභා

2014-06-03 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.